# තරුණ ප්‍රතිපත්ති වැඩසටහන

පාර්ශ්වකාර උපදෙස් විමසීම
දකුණු පළාත
ශ්‍රී ලංකාව

## පසු සාරාංශය

2016

## UNFPA ශ්‍රී ලංකාව



**එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල** (UNFPA) පසුගිය දශක සතරක කාලසීමාව පුරා ශ්‍රී ලංකාවේ රජය සමගින් තරුණයින්ගේ සහ කාන්තාවන්ගේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම් සම්බන්ධයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටී. මෑතකදී ශ්‍රී ලංකාව මධ්‍යම මට්ටමේ ආදායම් ලබන රටක් බවට පත්වීමත් සමගින් එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලද තම ඉලක්කයන් ප්‍රවේශයන් ඒ අනුව හැඩගස්වා ගනිමින් ධාරිතාවන් ගොඩ නැංවීම හා සේවා ලබාදීම යන ක්‍රියාමාර්ගයන් හි සිට ප්‍රතිපත්ති පිළිබඳ කතිකාවන්, ප්‍රතිපත්ති උපදේශන හා ප්‍රතිපත්ති අභිදේශන යන ක්‍රියාමාර්ග ඔස්සේ ශ්‍රී ලංකාවී තරුණයින්ට බලපාන ප්‍රධාන ගැටලු 4 ක් විසඳීම කෙරෙහි අවධානය යොමුකරන ලදී. මේවාට පහත සඳහන් කරුණු ඇතුලත් වේ.

1. **සංස්කෘතික සහ සමාජ බාධක**
2. **පරිපූර්ණ ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනයක් ලබාගැනීම සඳහා පවත්නා සීමාවන්**
3. **යෞවනයින්ට ප්‍රජානන සෞඛ්‍ය සේවා ලබාගැනීමේදී පවත්නා සීමාවන්**
4. **යෞවනයින් තුළ පවත්නා හැකියාවන් හඳුනාගැනීම සාධනීය කරන්නාවූ වාතාවරණයක් නොමැතිවීම**

**තරුණයින් වෙනුවෙන් ආයෝජනය කරන්නේ ඇයි**

නවයෞවන වියේ සිට වැඩිහිටි විය දක්වා ආරක්ෂාකාරීව සහ සාර්ථකව පියනැගීමට සෑම පුද්ගලයකුටම අයිතියක් ඇත. මෙම අයිතිය සපුරාලිය හැක්කේ යෞවනයින්ට ප්‍රගතිශීලී ලෙස දැනුම, කුශලතාවන් සහ සෞඛ්‍යමත් ඵලදායී සහ පරිපූර්ණ ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය ඔරොත්තු දීමේ ශක්තිය ලබාදීම සඳහා පවුල සහ සමාජය මේ වෙනුවෙන් විශේෂ අවධානය යොමුකර ආයෝජනය කරන්නේ නම් සහ ඒ සඳහා අවස්ථාවන් සලසන්නේ නම් පමණකි. මෙම තත්වය අන් කවරදාටත් වඩා ශ්‍රී ලංකාවට අද අවශ්‍යව තිබේ.

## UNFPA ශ්‍රී ලංකා යෞවන/තරුණ වැඩසටහන

UNFPA ශ්‍රී ලංකා තරුණ වැඩසටහන සාර්ව ප්‍රවේශයකින් යුත් වැඩසටහනක් වන අතර මෙහිදී ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ දී තරුණයින් මූලිකත්වය ගත් ප්‍රතිපත්ති සකස්කිරීම, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, තරුණ නායකත්වය සහ පරිපූර්ණ ප්‍රජජනන සෞඛ්‍ය අධ්‍යාපනය (CRHE) යනාදී ක්ෂේත්‍රයන්හි තරුණයින් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය වශයෙන් හඳුනාගනු ලබයි.

### පළාත් මට්ටමේ තරුණ ප්‍රතිපත්ති ව්‍යාපෘතිය


ශ්‍රී ලංකාවේ ජනගහනයෙන් හතරෙන් එකක් තරුණයින් වන බැවින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමින් ශක්තිමත් තරුණ ප්‍රතිපත්ති පැවැතිය යුතු බව UNFPA මැනවින් හඳුනාගෙන සිටී. ජාතික මට්ටමින් තරුණයින් මුහුණ දෙන අභියෝගයන් පවතින අතර සමහර ඒවා පළාත් වලට සුවිශේෂී වූ ඒවා වේ. මෙම අභියෝගයන් හඳුනාගැනීමටත් තරුණයින් වෙනුවෙන් ආයෝජනය කරන්නාවූ සාර්ව ප්‍රවේශයක් ක්‍රියාත්මක කිරීමත් තහවුරු කළ යුතුවේ. මෙම ව්‍යාපෘතිය මගින් UNFPA ශ්‍රී ලංකා ආයතනය සාර්ව තරුණ ප්‍රතිපත්ති සැකසීම සඳහා තාක්ෂණික සහාය සහ අභිදේශන සමගින් සියලුම පළාත් සම්බන්ධ කරගැනීමට අපේක්ෂා කරනු ලබයි.

මේ වන විට, එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල උතුර, සබරගමුව සහ දකුණු පළාත් සභාවල තරුණ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමට මැදිහත් වී තිබේ.

## ජනවිකාස වාසියේ ප්‍රතිලාභ නෙළා ගැනීම

වසර ගණනාවක් පුරා රජය විසින් නිදහස් අධ්‍යාපනය ලබාදෙමින් මෙන්ම නිදහස් සෞඛ්‍ය සේවා සපයමින් තරුණයින් වෙනුවෙන් අඛණ්ඩව ආයෝජනය කරමින් සිටී. කෙසේවෙතත් තරුණ අපේක්ෂාවන් සහ රජය අතර දිගින් දිගටම හොඳ සම්බන්ධතාවක් නොපැවති අතර මෙමගින් පසුගිය දශක හතර තුළ රටට මහත් විනාශයක් ගෙනදුන් ප්‍රචණ්ඩකාරී ස්වරූපයක් ගත් තරුණ නැගීසිටීම් අරගලයන් ඇතිවිය.

මේ අතර තරුණයින් විසින් මෙවැනි ප්‍රතිචාරයක් දක්වන ලද්දේ කුමන හේතූන් නිසාද යන්න පැහැදිලි කිරීම සඳහා නොයෙකුත් අවස්ථාවන්හි ප්‍රයත්න දරා තිබේ. දරිද්‍රතාවය, රැකියා විරහිතභාවය සහ ආන්තීකරණයට ලක්වීම මේවාට බලපෑ තීරණාත්මක සංරචකයන් ලෙස වැඩිවශයෙන් හඳුනාගෙන තිබේ. UNFPA ආයතනය යෞවනයින් සංවර්ධනයේ කේන්ද්‍රස්ථානය ලෙස සලකන අතර එමගින් තරුණයින්ට ඔවුන්ගේ හැකියාවන් මුදුන්පත් කරගැනීමට අවස්ථාවන් සලසනු ලබයි.




වර්තමාන ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.4 ක් වන අතර එයින් මිලියන 4.4 ක් වයස අවුරුදු (15-19) අතර පසුවන් තරුණයින් වේ. මෙම ප්‍රජාවිද්‍යාත්මක ලාභදායී තත්වයේ* අස්වනු නෙලීමට සඳහා තරුණයින්ට සහ නව යෞවනයින්ට මිත්‍රශීලී ප්‍රජනන සෞඛ්‍ය සේවාවන් සහ ඔවුන්ගේ අනෙකුත් අයිතිවාසිකම් සපුරාලීම තහවුරු කිරීම වෙනුවෙන් ඒකාබද්ධ සාක්ෂි පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කිරීමට ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ ආයතන වලට සහ අනෙකුත් පාර්ශවයින්ට UNFPA ශ්‍රී ලංකා ආයතනය සහාය දෙනු ලබයි.

එසේම UNFPA ශ්‍රී ලංකා යහපත් සාධනීය ප්‍රතිපත්ති වාතාවරණයක් සහ භාවිතාවන් ඇතිකිරීම මගින් තරුණයින්ට නායකත්වය ගැනීමට සහ රටට සාමය සහ තිරසාර සංවර්ධනය කරා පරිනාමනය වීමට දායකත්වය සලසනු ලබයි.

## තරුණ ප්‍රතිපත්තියට පරිපූර්ණ ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනයක් (CRHE) අවශ්‍ය වන්නේ ඇයි ?

තරුණයින්ට සමානාත්මතාවයෙන් සහ යහපැවැත්මෙන් යුත් ජීවිතයක් ගතකිරීමට, ඔවුන්ගේ හැකියාවන් උපරිම කරගැනීම සඳහා සහ ඔවුන්ගේ ප්‍රජාවේ තිරසාර සංවර්ධනයක් ඇතිකිරීම සඳහා තරුණයින්ගේ ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍ය හා අයිතිවාසිකම් වෙනුවෙන් ආයෝජනය කිරීම ඉතා වැදගත් වේ.

> පරිපූර්ණ ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනය තරුණ ජනතාවට ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කරගැනීමට සහ යහපැවැත්ම මෙන්ම ඔවුන් වැඩිහිටියන් වී පවුලේ වගකීම් දැරීම සඳහා වැදගත්වේ.

තරුණයින්ට ලිංගික සහ ප්‍රජනන සෞඛ්‍යය පද්ධතීන්ට අදාළව ශරීරය පිළිබඳව සහ භෞතවේදය පිළිබඳ මූලික දැනුමක් පැවැතිය යුතුය. මෙමගින් ඔවුන්ගේ ජීවිතය සම්බන්ධයෙන් දැනුම්වත්ව නිවැරදි කාලසීමාවන්හිදී නිවැරදි තීරණ ගැනීමට ඔවුන්ට හැකිවනු ඇත. වැරදි විශ්වාසයන් සහ දැනුමෙන් සහ කුශලාවන් දුර්වල මට්ටමක සිටීම මගින් ඔවුන්ගේ ජීවිතය පූර්ණ සාර්ථකත්වයන් කරා ලගාවීමේදී බාධාවන් පැමිණිවිය හැකියි.

## දකුණු පළාත් සභාවේ තරුණ ප්‍රතිපත්තිය සැකසීම

UNFPA ශ්‍රී ලංකා ආයතනය දකුණු පළාතේ තරුණයින් සඳහා තරුණ ප්‍රතිපත්තියක් සැකසීමට දකුණු පළාත් සභාව සමග සම්බන්ධ වී කටයුතු කරනු ලබයි. රජයේ, පෞද්ගලික අංශයේ, සිවිල් සමාජයේ සහ තරුණ නායකයින් ඇතුලු සියලුම පාර්ශවකරුවන් මෙම ප්‍රයත්නයට දායකත්වය ලබාදීම සඳහා එකට එක්වී ක්‍රියාකරනු ඇත.


මෙහි අරමුණ වන්නේ දකුණු පළාතේ කරුණයින්ට පවත්නා විශේෂ අවශ්‍යතා හඳුනාගැනීම සහ තරුණයින් කේන්ද්‍ර කරගත් ප්‍රතිපත්තියක් සැකසීමට අභිදේශන ක්‍රියාවලියක් ආරම්භ කිරීමත් ඒ සඳහා දකුණු පළාත් සභාවට අවශ්‍ය සහාය ලබාදීමත්ය.

- තරුණයින්ට තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහභාගී වීමට සහ තිරසාර සංවර්ධන ක්‍රියාවලියට නායකත්වය ලබාදෙමින් කටයුතු කළ හැකි සාධනීය වාතාවරණයක් සැකසීම
- පරිපූර්ණ ප්‍රජනන සෞඛ්‍ය අධ්‍යාපනයක් සහ අදාළ අයිතිවාසිකම් තුළින් තරුණ ජනතාව සවිබල ගැන්වීම

### දකුණු පළාතේ තරුණයින්ගේ සෞඛ්‍ය සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක මට්ටමින් දක්නට ලැබෙන විෂමතා

- කුරුණෑගල (4.1%), මාතර (4.6%) දිස්ත්‍රික්කවලට සාපේක්ෂව දකුණු පළාතේ හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි නවයොවුන් ගැබ්ගැනීම් ඉහළ මට්ටමක තිබේ (5.4%). මෙහි ජාතික සාමාන්‍යය 5.3%ක් වේ.
- ජාතික මට්ටම (8.8/1000) හා සසඳන විට දකුණු පළාතේ දිස්ත්‍රික්ක තුනෙහි ම ළදරු මරණ අනුපාතිකය පහළ අගයක් ගනී.
- ජාතික මාතෘ මර්ත්‍යතා මට්ටම වන දරු උපත් ලක්ෂයකට 32.5 සමග සන්සන්දනය කළ විට, හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි මාතෘ මර්ත්‍යතාව 39.8ක් වන ඉහළ මට්ටමක පවතී. එහෙත් ගාල්ල දිස්ත්‍රික්කයෙහි වාර්තා වන්නේ අඩු මාතෘ මරත්‍යතාවකි (27.4).

*Annual Report on Family Health Sri Lanka 2013, Family Health Bureau, Ministry of Health, Sri Lanka



**අනෙකුත් පළාත් හා සැසඳීමේ දී දකුණු පළාතේ තරුණයින්ගේ අධ්‍යාපනය සම්බන්ධ තත්වයන්**

- ජාතික සාමාන්‍යයන් (40.7%) සමග සන්සන්දනාත්මකව බැලූ කල, දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයෙහි ද්විතීයක අධ්‍යාපනය පහළ මට්ටමක පවතී (40.2%). එමෙන් ම, ජාතික මට්ටමේ සාමාන්‍ය පෙළ (17%), උසස් පෙළ (12.3%), උසස් අධ්‍යාපන (2.7%) සමග සන්සන්දනය කළ විට, දකුණු පළාතේ ඇත්තේ පහළ මට්ටමකි: සාමාන්‍ය පෙළ (16.2%), උසස් පෙළ (11.6%), උසස් අධ්‍යාපන (2.3%)
- ජාතික මට්ටමේ පරිගණක සාක්ෂරතා සාමාන්‍යය වන 25.1%ට සාපේක්ෂව දකුණු පළාතේ පරිගණක සාක්ෂරතාව 24.8%ක පහළ මට්ටමක පවතී.

*Department of Census and Statistics Ministry of Policy Planning Economic Affairs, Child Youth and Cultural Affairs, Sri Lanka Labour Force Survey Annual Report – 2014 and Sri Lanka's Socio-Economic Data – Central Bank June 2015

**දකුණු පළාතේ තරුණයින්ගේ රැකියා විරහිත භාවය පිළිබඳ දත්ත**

- ජාතික මට්ටම් (4.3%) හා සසඳන විට දකුණු පළාතේ රැකියා විරහිතභාවය 6% ඉහළ අගයක් ගනී
- ජාතික මට්ටමේ සාමාන්‍යය අගයන් (15.2% සහ 33%) හා සසඳන විට දකුණු පළාතේ රජයේ සේවකයින් හා ව්‍යවසායකයන් (16% සහ 34.7%) ඉහළ අගයක් ගනී. නමුත් ජාතික මට්ටමේ සාමාන්‍ය අගයන් (40.5%) හා සසඳන විට නැගෙනහිර පළාතේ පෞද්ගලික අංශයේ සේවකයන්ගේ ප්‍රතිශතය (38.9%) පහළ මට්ටමක පවතී

## තරුණ ප්‍රතිපත්තියක් ගෙන ඒම සඳහා අනුගමනය කරන ලද ක්‍රියාවලිය

**නියාමක තනතුර** - තරුණ කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා විසින් සැලසුම් අවධිය සම්බන්ධීකරණය සඳහා නියාමක තනතුරක් ඇතිකරන ලදී. මෙහිදී අදාළ පළාතේ පළාත් අමාත්‍යවරයා විසින් හෝ ලේකම් හෝ ඔවුන් විසින් පත්කරන ලද නිලධාරියා විසින් නායකත්වය ගනු ලබයි.

### පාර්ශවකරුවන්ගේ උපදේශන සාකච්ඡාව



පළමු පියවර ලෙස රාජ්‍ය අංශය, පෞද්ගලික අංශය, සිවිල් සමාජය, ආගමික නායකයින් මෙන්ම තරුණ නායකයින්ගෙන් සමන්විත පුද්ගලයින් එක්කර ගනිමින් බහුවිධ පාර්ශවකරුවන්ගේ ඉහල මට්ටමේ උපදේශන සාකච්ඡාවක් කැඳවන ලදී. ප්‍රතිපත්ති සකස් කිරීමේදී තරුණ සහභාගිත්වය පිළිබඳ වත්මන් ප්‍රවණතාවන් සහ පරතරයන් හඳුනාගැනීම සඳහා ඔවුන් තම විශේෂඥ දැනුමෙන් සහ සිය දර්ශනයෙන් දායකත්වය සපයන ලද අතර ඔවුන් යෞවනයින්ට අදාලව රැකීරක්ෂා, අධ්‍යාපනය, ප්‍රජනක සෞඛ්‍යය, සමාජ සහ සිවිල් සහභාගිත්වය සම්බන්ධයෙන් පුළුල් ලෙස සාකච්ඡා කරන ලදී. මෙම උපදේශන සාකච්ඡාවේ ප්‍රතිඵලයක් ලෙස කෙටුම්පත් කරන ලද ප්‍රතිපත්ති සඳහා වන නිර්දේශ ලේඛනයක් පහත දක්වා ඇත.

මෙම නිර්දේශයන් **ප්‍රතිපත්ති කෙටුම්පතක්** ලෙස සකස් කිරීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත්කරන ලදී. මෙම කමිටුවේ සභාපතිත්වය දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් දරනු ලැබූ අතර දකුණු පළාතේ දිස්ත්‍රික්ක තුන (ගාල්ල, මාතර සහ හම්බන්තොට) නියෝජනය කරන තෝරාගත් තරුණ නායකයින් ඊට ඇතුලත් කරනු ලැබීය.

ඉන් අනතුරුව ප්‍රමුඛත්වයක් සහිත අංශ යටතේ කාලරාමු සහ දර්ශකයන් සහිතව ක්‍රියාකාරිත්වයන් හඳුනාගන්නා ලදී. මෙම ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ඒවා ඉහළම ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සිදුකිරීම සඳහා එක්සත් ජාතීන්ගේ ජනගහණ අරමුදල (UNFPA) සිය තාක්ෂණ සහාය දිගටම සපයනු ඇත.



මෙම උපදෙස් සාකච්ඡාව සඳහා ගරු පළාත් සෞඛ්‍ය ඇමතිතුමන්, ලේකම් වරයා සහ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂ වරයාගේ සහ අදාල අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සහාය ලබාදෙන ලදී. ඊට අමතරව, ජාතික තරුණ සේවා සභාවේ පළාත් සහ දිස්ත්‍රික් මට්ටමේ ප්‍රමුඛ නිලධාරීන්, දිස්ත්‍රික් ලේකම් කාර්යා ලයේ තරුණ සේවා නිලධාරීන්, වෘත්තීය පුහුණු ආයතනය, විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්, සෑම ප්‍රජාවක්ම සහ ප්‍රදේශයක්ම නියෝජනය කරන තරුණ නායකයින් මේ සඳහා එක් වූහ. උපදේශන සාකච්ඡාවෙන් අනතුරුව දරිද්‍රතා විශ්ලේශණ කේන්ද්‍රය (CEPA) විසින් නිර්දේශ කෙටුම්පත් සහිත වාර්තාව සකස්කරන ලදී.

## සංක්ෂිප්ත නිර්දේශයන්



2015 දෙසැම්බර් මාසයේදී පවත්වන ලද බහුවිධ පාර්ශවකරුවන්ගේ උපදේශන සාකච්ඡාවේ සහ දකුණු පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කැඳවන ලද උපදේශන රැස්වීම් ගණනාවක ප්‍රතිඵලයක් ලෙස පහත සඳහන් නිර්දේශයන් ඉදිරිපත් විය. මෙම නිර්දේශයන් තිරසර සංවර්ධන අරමුණු ඇතුළු අන්තර්ජාතික, ජාතික සහ පළාත් සංවර්ධනය සඳහා සලකා බැලීම සඳහාය. පහත සඳහන් සෑම නිර්දේශයක් සඳහාම සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ සෑම මට්ටමක් සඳහාම යෞවනයින්ගේ සහභාගිත්වය වැදගත් වන්නේය. වයස අවුරුදු 15 සිට 29 දක්වා වූ අය යෞවනයින් ලෙස සලකනු ලැබීය. *(ශ්‍රී ලංකාවේ ජාතික යොවුන් ප්‍රතිපත්තිය -2014).*

මෙම උපදේශන සාකච්ඡා දරිද්‍රතා විශ්ලේශණ කේන්ද්‍රය (CEPA) විසින් සම්බන්ධීකරණය කරන ලදී. පහත දක්වා ඇති පරිදි මෙම නිර්දේශයන් පුළුල් ප්‍රභේදයන් තුනක් යටතේ සාකච්ඡා කරන ලදී.

**තරුණයින් සඳහා අවස්ථා - පශ්චාත් යුධ ආර්ථික වර්ධනය සහ සංවර්ධනය සලකා බලමින් යෞවනයින් සඳහා නිර්මාණය කරන ලද කාලීන අවස්ථා ඇතිවිය යුතුය.**

- සංචාරක කර්මාන්තය- සොබාදහම පදනම්වූ/ පාරිසරික සංචාරක කර්මාන්තය සහ වෙනත් සංවර්ධනය වන අංශ
- කෘෂිකර්මය සහ වැවිලි - මෙම අංශයන් තුල නවීන තාක්ෂණය සහ ශිල්පක්‍රම හඳුන්වාදීම සහ සිය නිපුණතා සහ වටිනාකම් දියුණුකර ගැනීමට යෞවනයින් දිරිගැන්වීම.
- ධීවර කර්මාන්තය- ඩිප්ලෝමා පාඨමාලා සහ වෙනත් පුහුණු තුළින් සම අධ්‍යාපන අවස්ථා, නිපුණතා සංවර්ධනය සහ වර්ධනය කෙරෙහි යෞවනයින් සම්බන්ධ කිරීම සහ ක්‍රමවේදයන් වෘත්තීයමය තත්වයකට පත්කිරීම මගින් වෘත්තියේ/කර්මාන්තයේ පිළිගැනීම ඉහල නැංවීම.

- පාරම්පරික සහ පාරම්පරික නොවන ව්‍යවසායකත්ව වැඩසටහන් තවදුරටත් සවිමත් කිරීම සහ ඒවා සංචාරක කර්මාන්තය ඇතුළු කර්මාන්ත සහ වෙළඳපොළ වෙත උපායමාර්ගිකව සම්බන්ධ කිරීම.

- **යෞවනයින් බලගැන්වීම –** යෞවනයින් විධිමත් මෙන්ම අවිධිමත් අංශ යටතට ගැනෙන බව අවබෝධ කර ගනිමින් ඔවුන්ට අවශ්‍ය නිපුණතාවන් සංවර්ධනය කරගනිමින් සමාජයේ පූර්ණ ලෙස සහභාගි වීමට අවශ්‍ය ආයතන සහ මාවත් කරා ප්‍රවේශ වීමේ අවස්ථාව ලබා දිය යුතුය. විශේෂයෙන්ම විධිමත් ආයතනවලට ඇතුල්වීමට අපොහොසත්වූ අය සඳහා මෙය විශේෂයෙන්ම සිදු විය යුතුය.

    - භාෂා අයිතීන් හඳුනා ගනිමින්, සිය සංස්කෘතික සහ ආචාරධර්ම වටිනාකම් සංවර්ධනය කිරීම සඳහා වෙනත් ආගම් සහ සිරිත් විරිත් ඉගෙන ගැනීමේ වැදගත්කම සහ  සවිස්තර ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනයේ වැදගත්කම වටහාගනිමින් පාසැල් අධ්‍යාපනයේ සාධාරණත්වය සහ සමානාත්මතාව වැඩිදියුණු කිරීම.  ගුරුවරුන්, පුහුණු සහ තොරතුරු තාක්ෂණ පහසුකම් ආදියෙන් ග්‍රාමීය පාසැල්වල පහසුකම් වැඩිදියුණු කිරීමට පියවර ගත යුතුය.
    - වෘත්තීය පුහුණුව සහ නිපුණතා සංවර්ධනය - නිපුණතා සංවර්ධනය සඳහා කැපවුනු ආයතන කරා යාම සඳහා දුගී අයට ණය වැඩසටහන් සහ වෙනත් පහසුකම් සැපයීම. දේශීය උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලාවල ප්‍රමිතිය ජාත්‍යන්තරව පිළිගත් තත්වයන් දක්වා වැඩිදියුණු කිරීම. ලබාදිය හැකි හොඳම පහසුකම් සහ පුහුණුවලත් පහසුකම් සපයන්නන්ගෙත් සේවය සහතික කිරීම සඳහා වෘත්තීය පුහුණු යටිතල පහසුකම් සඳහා අයෝජනය කිරීම.
    - සෞඛ්‍යය සහ යහපැවැත්ම - ක්‍රීඩා පහසුකම් වැඩිදියුණු කිරීම සහ තරුණ සමාජ සඳහා ප්‍රමාණවත් මුල්‍යාධාර වෙන්කිරීම. සෑම යෞවනයෙකුම මානසික සහ ශාරීරික වශයෙන් සාකල්‍ය අධ්‍යාපනයක් ලබාගැනීම සනාථ කිරීම සඳහා සෑම මට්ටමක් සඳහාම සවිස්තරාත්මක ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනයක් සහ දැනුමක් ලබාදීම.
    - ක්‍රීඩාව සහ කලාව - ගාලු සාහිත්‍ය උළෙල වැනි ජාත්‍යන්තර වැඩසටහන් යොදගනිමින් යෞවනයින් ක්‍රීඩාවේ සහ කලාවේ නිරත වීම ප්‍රවර්ධනය කරමින් ඔවුන්ට වඩා යහපත් ජීවිත ගතකිරීමට සහ සංනිවේදන හැකියාවන් වර්ධනය කර ගැනීමට අවස්ථාව ලබා දීම.

- **තරුණයින් සඳහා ආරක්ෂක ජාලයක්**
- පාසැල් ආගමික සහ සංස්කෘතික ආයතන හා එක් කරමින් සහ පාසැල් හා සම්බන්ධ ප්‍රායෝගික වැඩසටහන් සහ වැඩමුළු මගින් යෞවන හැකියාවන් වළක්වාලන ආකල්පයන්ගෙන් මුදවාගැනීමට කටයුතු කිරීම.
- දේශපාලන නියෝජනයේ යෞවන සහභාගිත්වය-  පළාත් පාලන මට්ටමෙන් යෞවන සහභාගිත්වය වැඩිදියුණු කිරිම සහ ප්‍රජාවන් අතර සහ ජාතික මට්ටමේ ප්‍රතිපූරණ සමග විශ්වාසය නැවත ගොඩනැගීම සඳහා ඔවුන් අර්ථාන්විතව යොදගැනිම.
- දුගීබව, කොන්කිරීම හා සම්බන්ධ සමාජ ගැටළු - ප්‍රජනක සෞඛ්‍ය අධ්‍යාපනය හඳුන්වාදීම සහ ලිංගාශ්‍රිත රෝග පිළිබඳව දැනුවත් කිරීම, කොන්කරන ලද (කුලය, ගෝත්‍රය ආගම ආදිය නිසා) යොවුන් කණ්ඩායම් ඇතුළත් කර ගැනීමේ යාන්ත්‍රණයන් හඳුන්වා දීම.

* ඉහත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතා විශ්ලේශණ කේන්ද්‍රයේ (CEPA) බාහිර උපදේශකයින් විසින් සම්පාදනය කළ පශ්චාත් උපදේශන වාර්තාවෙන් ලබාගත් නිර්දේශයන්ගේ සංක්ෂිප්තයකි. මෙම වාර්තාවේ වැඩිදුර විස්තර ශ්‍රී ලංකාවේ  දරිද්‍රතා විශ්ලේශණ කේන්ද්‍රය (CEPA)  හෝ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) සම්බන්ධ කර ගැනීමෙන් ලබාගත හැකිය.

## UNFPA තරුණ වැඩසටහනේ ප්‍රකාශන





ශ්‍රී ලංකාවේ මිලියන 20.4 ජනගහනය පිළිබඳ සාරාංශයක් (2015)




100 Voices වෙනසක් ඇතිකිරීම සඳහාවූ විශේෂ ව්‍යාපාරය (2015)




ජාතික තරුණ සෞඛ්‍ය සමීක්ෂණය 2012/2013 (2016)




පරම්පරාවෙන් පරම්පරාවට වූ කතිකාව - සිංහල සහ දෙමළ මාධ්‍ය වලින් ලබාගත හැකිය (2015)




ශ්‍රී ලංකාවේ ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන් සඳහා චර්යාවන් වෙනස් කිරීමේ සන්නිවේදන ක්‍රමෝපායයන් (2014)




Delivering for Women and Young People (2014) කාන්තාවන්ට සහ තරුණ ජනතාවට සේවා ලබාදීම


**වැඩිදුර තොරතුරු සඳහා**

අමතන්න නෙශාන් ගුණසේකර -උපදේශක, ප්‍රතිපත්ති විශ්ලේෂක -තරුණ සහ යෞවන ජනතාව

එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල, ශ්‍රී ලංකාව අංක 202, බෞද්ධාලෝක මාවත කොළඹ 07.

Email: ngunasekera@unfpa.org, Tel: + 94 (011) 2580840


www.srilanka.unfpa.org

www.facebook.com/unfpa.srilanka

www.twitter.com/UNFPASriLanka